# Holiday Assignments

**ADVANCE LEVEL**

**Subject: Media** **Grade 13** **Medium: Sinhala**

සන්නිවේදනය හා මාධ්‍ය සමීක්‍ෂණ

- මානව සම්බන්ධතා පවත්වා ගෙන යාමේ ක්‍රියාවලිය සන්නිවේදනය මත රඳා පවතී. සන්නිවේදන තාක්ෂණයේ දියුණුව, ජනමාධ්‍යයේ බිහි වීම හා ව්‍යාප්තිය මානව සම්බන්ධතා සංකීර්ණ කිරීමට හේතු වී ඇත.

- මාධ්‍ය සමීක්ෂණ හෙවත් ග්‍රාහක සමීක්ෂණ මඟින් මාධ්‍ය පිළිබඳ ග්‍රාහක ප්‍රතිචාර කෙබඳු ද, මාධ්‍ය මඟින් ග්‍රාහකයා කෙරෙහි ඇති කරනු ලබන බලපෑම කවර ආකාර ද යන්න හඳුනා ගත හැකි ය.



- මාධ්‍ය පිළිබඳ ග්‍රාහකයාගේ ප්‍රතිචාර කෙබඳු ද යන්න හඳුනා ගැනීමට මෙන් ම මාධ්‍ය මඟින් ග්‍රාහකයා කෙරෙහි ඇති කරන බලපෑම කවර ආකාර ද යන්න හඳුනා ගැනීම සඳහා මාධ්‍ය සමීක්‍ෂණ යොදා ගනු ලබයි.

- මෙහි දී සාම්ප්‍රදායික මාධ්‍ය, ජනමාධ්‍ය හා නවමාධ්‍ය ආදි ක්ෂේත්‍ර මාධ්‍ය සමීක්‍ෂණ සඳහා යොදා ගත හැකි අතර ග්‍රාහකත්වය, පාඨකයා, ශ්‍රාවකයා, නරඹන්නා, ප්‍රේක්ෂකයා සහ පරිශීලකයා දත්ත දායකයන් ලෙස සහභාගී කර ගත හැකි ය.

මාධ්‍ය සමීක්ෂණ මඟින් සන්නිවේදකයා, නාලිකාව, සන්දේශය, ග්‍රාහකයා හා බලපෑම යනාදියෙහි තත්ත්වය, ජනප්‍රියත්වය, ගුණාත්මකභාවය, ආකර්ෂණීය බව, තාක්ෂණික භාවිතය හා සමාජ බලපෑම පිළිබඳ ග්‍රාහකයා දක්වන කැමැත්ත, අදහස්, මතවාද හා යෝජනා ලබා ගැනීම සිදු කෙරේ.

මාධ්‍ය සමීක්ෂණ විශේෂ අවස්ථාවක දී හෝ වාරානුකූල ව හෝ පැවැත්විය හැකි ය. එමඟින් කලින් කලට මාධ්‍ය හැසිරීම් රටා වෙනස් වන ආකාරය හඳුනා ගත හැකි ය.